# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 59 — 1973 මැයි 11 වැනි සිකුරාදා — 1973.05.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකමම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 569 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩරයක් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 572 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | 574 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1973. 5. 1 සිට 73. 12. 31 දක්වා මෙරට සෑදූ පිත්තල සහ යකඩ ඉස්කුරුප්පු ඇණ සැපයීම ... | 1973. 6. 1 |
| 2. මෙරට නිෂ්පාදිත කාකි පීක් තොප්පි සැපයීමට... | 1973. 6. 1 |

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 මැයි 11 වැනි දින,
කොළඹ දී ය.

5–205—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා 73.6.12 වෙනි දින ප. ව. 1.30 තෙක් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය. | | සැපයීම් විස්තර | | | අවශ්‍ය ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|
| එම්.ටී/3/727312 | ... | වොල්ටේජ් ස්ටැබිලයිසර් | 4 යි. | ... | රු. 25.00 |
| එම්.ටී/3/727313 | ... | බීජ රක්නයන් | 4 යි. | ... | රු. 25.00 |
| එම්.ටී/3/727314 | ... | විදුලියෙන් ක්‍රියාකරන වතුර පොම්ප | 2 යි. | ... | රු. 25.00 |
| එම්.ටී/3/727315 | ... | ප්‍රබල පරිමාන බලවේග/ ඉසින යන්ත්‍ර | 5 යි. | ... | රු. 25.00 |

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිපත්‍ර වල ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර එම පිටපත් නිඩ්යාකාරව සම්පූර්ණ කර අත්සන් තබා සිල් තැබූ කවරයක බහා එකී වම් උඩ කෙළවරේ 'යන්ත්‍රෝපකරණ සඳහා ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය 73.6.12 දින ප. ව. 1.30' යන්න සඳහන් කොට පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

4. 73.6.9 වෙනි දින ඇතුළුව එතෙක් පමණක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. මීට පසු ටෙන්ඩර් නිකුත් කරනු නොලැබේ.

5. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් තැන්පත් කළ යුතු මුදල වන රු. 25 පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදි ශාඛාවේ ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 දරණ ගිනුමේ අයට මුදල් තැන්පත් කළ බවට නිකුත් කරනු ලබන කුවිතාන්සියක් මත පමණයි.

6. කිසිම වග විභාගයක් නොමැතිව, එවන ලද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම හෝ එම ටෙන්ඩර් පතකින් කොටසක් හෝ සම්පූර්ණ එකම භාර ගැනීමේ හිමිකම රජය සතුවේ.

7. වැඩිමනත් විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය (ඉංජිනේරු) කාර්යාලයෙන් ලබාගත හැකියි.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 අප්‍රේල් මස 26 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
ඉංජිනේරු අංශයේ දීය.

5–203—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් දැන්වීමයි—මාතලේ දිස්ත්‍රික්කය

### නාලන්ද තානායම ප්‍රතිසංස්කරණය කිරීම

මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද තානායම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම පිණිස මා විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1973 ජූනි මස 08 දින පස්වරු 2 දක්වා භාරගනු ලැබේ. 1973 ජූනි මස 08 දින පස්වරු 2 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අතර එම වේලාවේදී ටෙන්ඩර් ඉල්ලුම් කරුවන්ට තමන් කැමති නම් ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය හැක.

2. ටෙන්ඩර් පත් මාතලේ දිසාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත්, මාතලේ දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රයේ ඇති සියලුම වෙනස් කිරීම් ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර 1973 ජූනි මස 08 දින දවල් 12 දක්වා මාතලේ දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක. මෙසේ ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘතියේ හැර, වෙනත් ටෙන්ඩර් ආකෘතිවලින් එවන ටෙන්ඩර් භාරගනු නො ලැබේ.

4. නාලන්ද තානායමේ ප්‍රතිසංස්කරණ වැඩ සඳහා රු. 25 ක් තැන්පත් කොට ලබා ගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කිරීමෙන්, ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක. එසේම එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා එවිය යුතුයි. එහි කවරයේ වම්පස උඩ කොටසේ "නාලන්ද තානායම ප්‍රතිසංස්කරණය කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් සියයට 5 ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය. එසේම, ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බව දන්වා දින හතක් ඇතුළත වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට පැමිණිය යුතුය. එසේ කිරීමට අතපසු කරතොත්, හෝ වැඩ ගිවිසුම අත්සන් කිරීමට ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නො දක්වා ටෙන්ඩර් සියල්ලම හෝ ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීමට මාතලේ දිසාපතිට හැක.

7. මාතලේ දිසාපතිගෙන් අවසරයක් නො ලබා ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ භාරදීමට පුළුවන් කමක් නැත. එසේම පත්කර ගන්නා ලද ටෙන්ඩර්කරු වැඩය කරවන ප්‍රදේශයේ අවශ්‍යතාවයන් අනුව පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් යෙදවිය යුතුය.

8. ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක්කේ රු. 40,000 ක කොන්ත්‍රාත් කිරීම සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි කළ සහතිකය ඉදිරිපත් කිරීමෙනි. ලියාපදිංචි නොවූ අයට නම් තමාට රු. 40,000 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් කිරීමට හැකියාවක් ඇති බවට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් සහතිකයක් ඇතිව පැමිණිය යුතුය.

9. ලියාපදිංචි සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම හෝ ඇප මුදල් තැන්පත් කිරීමට හෝ අවශ්‍ය නැත. සමිති ලියාපදිංචි කළ බවටද වැඩය භාරගෙන කිරීමට හැකියාවක් ඇති බවට, ඒ ඒ දෙපාතීමේන්තු වල ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. තවද, වැඩය භාරගෙන කිරීමට සතුටු බව සනාථ කරන සමිතියේ සම්මතකරගත් වාර්තාවක පිටපතක් ද ඉදිරිපත් කළ යුතුය.

10. ටෙන්ඩර්කරුවන් කැමති නම්, අදාල සැලැස්ම මෙම කාර්යාලයේදී කාර්යාල වේලාවේදී පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර අවශ්‍ය නම් මාතලේ දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

මාතලේ දිසාපති.

1973 අප්‍රේල් මස 30 වැනි දින,
මාතලේ දිසාපති කාර්යාලයේ දී ය.

5–200—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

පොලිතෙලින් ලයිනෝල් 1000 රන්තල් 3000 සැපයීම සඳහා ඒවා නිපදවන්නන්ගෙන් හා ඔවුන්ගේ නියෝජිතයින්ගෙන්, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 07. 11 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. වැඩි විස්තර හා ටෙන්ඩර් පත් සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය 3/1/-(4/34).
කුඩා කර්මාන්ත දෙපාතීමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1.
1973. 04. 30

5–210—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

බුමුතුරුණු සඳහා නූල් සැපයීම සඳහා ඒවා නිපදවන්නන් සහ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973. 06. 26 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් පත්‍රය සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු 3/1/-(2/16)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල. කොළඹ 1.
1973 අප්‍රේල් මස 30 වැනි දින.

5–211—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව**

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බටගන්විට බලවේග පේෂකර්ම ආයතනය වටා කටු කම්බි ගැසීම සඳහා 73.5.31 දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. රු. 5,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි කටයුතු සඳහා ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම නිකුත් කැරෙනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තුවේ මෙම කාර්යාලයේ හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාල යක රු.25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා ලියාපදිංචි වීමට එම ලදුපත 73.5.30 දින දවල් 12 ට හෝ ඉන් පෙර ඉදිරිපත් කළ යුතුයි.

සෝමපාල ගුණධීර
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව 3/1 (1/46)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973 අප්‍රේල් මස 30 වැනි දින.

5–208—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව**

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මොරටුව, වෙලෝනාහි රෙදිනිමහම් ආයතන ගොඩනැගිල්ලේ වහලයට ඇස්බැස්ටෝස් සිලිං ගැසීම සඳහා 73.5.31 දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. රු. 5000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි කටයුතු සඳහා ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම නිකුත් කැරෙනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තුවේ මෙම කාර්යාලයේ හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාල යක රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා ලියාපදිංචි වීමට එම ලදුපත 73.5.30 දින දවල් 12 ට හෝ ඉන් පෙර ඉදිරිපත් කළ යුතුයි.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව 3/1 (1/45)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973 අප්‍රේල් මස 30 වැනි දින.

5–209—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව**

පහත සඳහන් සැපයීම් සඳහා එක් එක් සැපයීම ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 දක්වා මිල ගණන් භාර ගනු ලැබේ.

| සැපයීමේ විස්තරය | අවසන් වන දිනය |
|---|---|
| 1. ටැප්ස්, ඩයිස්, රීමර්ස් ආදිය ... | 14.06.73 |
| 2. ගිනිගල් (Grinding Wheels) ... | 21.06.73 |

එක් එක් සැපයීම සඳහා රු. 100 ක ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම කොළ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් අවසන් වන දිනයන්ට පළමු වැඩ කරන දින යන්හි දහවල් 12 න් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් එක් එක් ටෙන්ඩරය සඳහා රු. 10 ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහභාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර, කොළඹ 5.

5–163—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

**පිස්කල් කාර්යාලයය කොළඹ**

දැන්වීමයි

1973 මැයි මස 19 වැනි සෙනසුරාදා පෙ. ව. 11.30 ට පහත සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනවා ඇත.

| | | |
|---|---|---|
| 1. හම් අත් බෑග් | ... ... | 1යි |
| 2. කුඩා බෑග් හම් | ... ... | 1යි |
| 3. ටයිප් රයිටර් (ඉම්පීරියල් ඉංග්‍රීසි) | ... | 1යි |

2. වෙන්දේසි කරන දිනයට පෙර දින මෙම භාණ්ඩ මෙම කාර්යාලයේදී බලා ගත හැකිය. වෙන්දේසියෙන් පසු මේ සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි භාර නොගන්නවා ඇත.

3. වෙන්දේසියෙන් පසු මෙම භාණ්ඩ ලබාගත් ඉල්ලුම්කරුවන් විසින් එම මොහොතේම සම්පූර්ණ මුදල ගෙවා තම තමන් ගත් භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

ඩබ්ලිව්. ජේ. බයස්,
බ. ප. පිස්කල් වෙනුවට.

1973 අප්‍රියෙල් මස 28 වෙනි දින,
කොළඹ පිස්කල් කාර්යාලයේ දී ය.

5–202—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**රේගු වෙන්දේසියක්**

පහත සඳහන් භාණ්ඩ 1973 මැයි මස 27 වැනි ඉරුදින පෙරවරු 9 ට කොළඹ ශ්‍රී ලංකා රේගුවේ මගින් ගොඩබසින පයයින්ත වේදිකාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1973 මැයි මස 26 වැනි සෙනසුරාදා පෙරවරු 9.30 සිට දහවල් 12 දක්වා ඉහතකී ස්ථානයේදී මෙම භාණ්ඩ පරීක්ෂණය සඳහා මහජනයාට ප්‍රදර්ශනය කරනු ලැබේ.

ගුවන් විදුලි යන්ත්‍ර, ටේප් රෙකෝඩර් සහ ඔර්ලෝසු මිලදී ගත හැක්කේ, එක් පුද්ගලයෙකුට එකක් පමණක් වන අතර ඒවා විකිණීම කරනු ලබන්නේ වෙනත් පුද්ගලයෙකුට පැවරීම හෝ විකිණීම නොකළ යුතුය යන පදනම මතය.

මේ ගැන අනෙක් කොන්දේසි සඳහා කරුණාකර 1972 අගෝස්තු මස 4 වැනි දින රජයේ ගැසට් පත්‍රයය බලන්න.

පී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය: පී.බී/විකිණීම්/25/73,
1973 අප්‍රේල් මස 24 වැනි දින,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ.

පී. බී. විකිණීම් 25/73

1. දාතම සහිත සිකෝ ඩයමන්ඩ් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
2. දාතම සහිත සිකෝ ඩයමන්ඩ් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
3. දාතම සහිත සිකෝ ඩයමන්ඩ් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
4. දාතම සහිත සිකෝ ඩයමන්ඩ් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
5. දාතම සහිත 'සිකෝ' 5 මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
6. දාතම සහිත 'සිකෝ' 5 මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
7. දාතම සහිත 'සිකෝ' ඩයමන්ඩ් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
8. දාතම සහිත 'සිකෝ' ඩයමන්ඩ් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
9. දාතම සහිත 'සිකෝ' ඩයමන්ඩ් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
10. දාතම සහිත 'සිකෝ' 5 මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
11. දාතම සහිත 'සිකෝ' 5 මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,

12. දාතම සහිත 'සීකෝ' 5 මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
13. දාතම සහිත 'සීකෝ' 5 මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
14. දාතම සහිත 'සීකෝ' 5 මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
15. ඩිරිමෙක්ස් මොඩ් අත් ඔර්ලෝසුවක්,
16. "ඕල්ඩ් ප්‍රෙන්ඩ් ශෝගෝ" මොඩ් අත් ඔර්ලෝසුවක්,
17. "ජෙස්මර් ස්කයිමාස්ටර්" මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
18. එස්කොට් ඩිලුක්ස් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
19. 'හෙන්රි සැන්ඩොස්' මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
20. 'එම්ට්' මොඩ් දින සහ දාතම සහිත ඔර්ලෝසුවක්,
21. 'වයිලර් බාෂ්' ඔර්ලෝසුවක්,
22. ඩුයිමෙක්ස් රෙක්ස්බෝ නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් (මාරුකල හැකි පටිත් සමග),
23. 'රෝමර්' මැණික්ගල් 17 සහිත පිරිමි අත් ඔර්ලෝසුවක්,
24. 'සිටිසන් නිව්මාස්ටර්' ඔටෝමැටික් පිරිමි අත් ඔර්ලෝසුවක්,
25. 'රෝමර් සුපර් කිං' මැණික් ගල් 17 මහතුන්ගේ අත් ඔර්ලෙසුවක්,
26. 'රිකෝ' මැණික්ගල් 17 නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
27. 'මේවා' මැණික්ගල් 17 නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුක්,
28. 'මේවා' මැණික්ගල් 17 නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුක්,
29. 'මේවා' මැණික්ගල් 17 නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුක්,
30. 'සිටිසන්' මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්—634239,
31. 'රෝමර්' පොපියුලර් මැණික්ගල් 17 පිරිමි අත් ඔර්ලෝසුවක්,
32. 'සීකෝ' ස්වයංක්‍රීය දින සහිත මැණික්ගල් 29 මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
33. 'සීකෝ' ස්වයංක්‍රීය දින සහිත මැණික්ගල් 29 මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
34. 'ඔමේගා' කොන්ස්ටලේෂන් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්, පටිය සමග (පාවිච්චි කරන ලද),
35. පාව්රේ ලියුබා සිව්ප් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
36. 'වයිකෝස්' මැණික්ගල් 17 නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුව පටියත් සමග (පාවිච්චි කල),
37. ඇන්කර් මැණික්ගල් 17 නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
38. 'ඔනිමා' ඩිලුක්ස් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
39. 'කුවුන්' ස්ටීරියෝ ත්‍රී ඉන්වන් මොඩල් එස් සිපී/71 එස්. ඩබ්.,
40. 'හෙන්රි සැන්ඩෝස්' මැණික්ගල් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
41. 'ෂෝර්බා' මැණික්ගල් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
42. පෝල්ස් ඩිලුක්ස් මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
43. 'රිකෝ' (පාවිච්චිකල) ඔටෝමැටික් දින සහ දාතම සහිත මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්,
44. 'ඩුයිමෙක්ස්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක්, මාරුකල හැකි මුහුනත සහ පටිය සමග,
45. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
46. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
47. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
48. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
48. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
49. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
50. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
51. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
52. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
53. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
54. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
55. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
56. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
57. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
58. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
59. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
60. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
61. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
62. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
63. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
64. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
65. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
66. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
67. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
68. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
69. 'බියුලර්' නෝනා මහතුන්ගේ අත් ඔර්ලෝසුවක් මාරුකල හැකි මුහුණත සහ පටිය සමග,
70. 'ඔමේගා' ස්වයංක්‍රීය ඔර්ලෝසුවක්,
71. 'අකායි' සොලිඩ් ස්ටේට් 1720 එල් ටේප්රෙකෝඩර් එකක්, මයික්‍රොපෝන් දෙකක් සහිත මාර්ග හතරේ ස්ටිරියෝ එකක් අංක 51109-02722,
72. රෙකෝඩ් කරන ලද කැසට් තුනක්,
73. නෝනා මහතුන්ගේ නයිලෝන් ස්පෝර්ට් කමිසයක්—මධ්‍යම ප්‍රමාණය, ට්රේවිත් ඩ්‍රිල් සුට් රෙදදක්—යාර 3, ගමන් මළු එකක්,
74. (ඒ) මනිපුරි සාරියක්,
(බී) ස්පෝර්ට්ස් කමිස දෙකක් (මධ්‍යම ප්‍රමාණය),
(සී) ස්පෝර්ට්ස් කමිස දෙකක් (මධ්‍යම ප්‍රමාණය),
(ඩී) ස්පෝර්ට්ස් කමිස දෙකක් (මධ්‍යම ප්‍රමාණය),
(ඊ) ස්පෝර්ට්ස් කමිස දෙකක් (මධ්‍යම ප්‍රමාණය),
(එෆ්) ස්පෝර්ට්ස් කමිස තුනක් (මධ්‍යම ප්‍රමාණය),
75. කෘතිම සිල්ක් සාරි තුනක්,
76. (අ) නයිලෙක්ස් සාරි දෙකක්,
(ආ) නයිලෙක්ස් සාරි දෙකක්,
(ඇ) නයිලෙක්ස් සාරි දෙකක්,
(ඈ) කපු වොයිල් සාරි එකක් (පලුදු වූ),
(ඉ) නයිලෙක්ස් සාරි එකක්,
77. අත් බෙත්තම් ජෝඩු 11 ක්,
78. නැෂනල් පැනසොනික් පොකට් රේඩියෝවක් අංක-94874, නැෂනල් පැනසොනික් පොකට් රේඩියෝවක් අංක 71241, නැෂනල් පැනසොනික් ආර්. 222 එච්/තරංග මාලා දෙකේ එච්. බී. 47201 රේඩියෝවක් (සම් කොපුව සමග),
79. චීන එලාම් ඔර්ලෝසු එකක්,
චීන එලාම් ඔර්ලෝසු එකක්,
80. තරංග මාලා දෙකේ 'මොනාරෝ' කාර් රේඩියෝ එකක්,
81. කෘතිම සිල්ක් සරොම් දෙකක් කපු සරොමක් (පලුදු වූ),
82. 'නැෂනල් පැනසොනික්' තරංග මාලා 3 නේ රේඩියෝව සම්කොපුව සහිත අංක 90298,
83. 'නැෂනල් පැනසොනික්' ආර්. 441 බී තරංග මාලා 4—වර්ල්ඩ් සිස්ටර් 6 රේඩියෝව—අංක 576988,
84. (අ) මංගල සාරි එකයි,
(ආ) මනිපූරි සාරි එකයි,
(ඇ) බ්‍රොකේඩ් සාරි එකයි,
(ඈ) මනිපූරි සාරි එකයි,
85. කෘතිම සිල්ක් සාරි දෙකක්,
86. බ්‍රොකේඩ් සාරි එකක්, මුද්‍රිත නයිලෙක්ස් සාරි එකක්,

87. කාංජීපුරම් සාරි එකයි.
හැට්ට රෙදි කැල්ල සමග කාංජීපුරම් සාරි එකයි,
හැට්ට රෙදි කැල්ල සමග කාංජීපුරම් සාරි එකයි,
හැට්ට රෙදි කැල්ල සමග කාංජීපුරම් සාරි එකයි,
හැට්ට රෙදි කැල්ල සමග කාංජීපුරම් සාරි එකයි,
හැට්ට රෙදි කැල්ල සමග කාංජීපුරම් සාරි එකයි,

88. 'පිලිප්ස්' කැසට් ටේප් රෙකෝඩර් එකයි, අංක 120879,

89. ඕඩිකොලෝං බෝතල් 3 යි,

90. කඩදාසි කුට්ටම් 7 යි,

91. තෝනා මහතුන්ගේ කුඩ දෙකයි,
තෝනා මහතුන්ගේ කුඩ දෙකයි,

92. කෘත්‍රිම සිල්ක් වෙට්ටියක් සහ කරපටියක්,

93. මුද්‍රිත නයිලෙක්ස් සාරි එකයි,

94. මුද්‍රිත නයිලෙක්ස් සාරි තුනයි,

95. නයිලෙක්ස් සාරි දෙකයි,
නයිලෙක්ස් සාරි දෙකයි,
නයිලෙක්ස් සාරි දෙකයි,
නයිලෙක්ස් සාරි දෙකයි,

96. මංගල සාරි එකයි,
කාංජීපුරම් සාරි එකයි,
කාංජීපුරම් සාරි එකයි,

97. 'පිලිප්ස්' ට්‍රාන්සිස්ටර් රේඩියෝවක් තරංග මාලා 3 යි, අංක 19734103,

98. 'පිලිප්ස්' ට්‍රාන්සිස්ටර් රේඩියෝවක් තරංග මාලා 3 යි, අංක 734077,

99. 'පිලිප්ස්' ට්‍රාන්සිස්ටර් රේඩියෝවක් තරංග මාලා 3 යි,

100. 'පිලිප්ස්' ට්‍රාන්සිස්ටර් තරංග මාලා 3 රේඩියෝවක්—අංක 734075,

101. ලොම් තොප්පි එකයි, ගමන් මලු එකයි,

102. 'පිලිප්ස්' බිල් ට්‍රාන්සිස්ටර් රේඩියෝවක්, අංක 24770,

103. 'නැෂනල් පැනසොනික්' ආර් 441 බී තරංග මාලා 4—ට්‍රාන්සිස්ටර් රේඩියෝවක්, අංක 30999,

104. 'සන්යෝ' කැසට් රෙකෝඩර් එකයි—එම්. ආර්. 410—මයික්‍රොෆෝනයක් සමග අංක 73451655,

105. 'සන්යෝ' තරංග මාලා 3—ට්‍රාන්සිස්ටර් 10 රේඩියෝවක් සම් කොපුව සමග අංක 92470738,

106. මංමිප් සුවඳ ස්ප්‍රිත්තු බෝතල් පහයි (5),

107. ඕඩිකොලෝං බෝතල් දෙකයි,

108. ඉස්කුරුප්පු වර්ගයේ විදුලි බුබුලු 2 යි.

5–148—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ප්‍රසිද්ධ වෙන්දේසිය

බලපිටියේ දිස්ත්‍රික් උසාවියේ අංක ඇන්. පී. 556 දරණ බෙදුම් නඩුවෙන් මා වෙත නිකුත් කරණ ලද කොමිෂන් බලය පිට, එකී නඩු තීන්දුවේ නියෝග සහ 1951 කෝ අංක 16 දරණ බෙදුම් පනතේ 41 වැනි ඡේදයට අනුකූලව මෙහි පහත සඳහන් ඉඩම් කැබලි වර්ෂ 1973 ක්වූ ජූනි මස 21 වෙනි බ්‍රහස්පතින්දා සවස 3.30 පටන්ගෙන එහිදීම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. ගාළු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ පිහිටි ඉස්කාකර බත්බරවත්තේ බෙදාවෙන් කල දකුණු කැබැල්ලේ ඒ අක්ෂරය නම්වූ පාර්චස් දහහතකුත් දසම තුනයි අටක් (පා. 17.38) විශාල බෙදාවෙන් කල ඉඩම් කැබැල්ල සහ එහි තුල පිහිටි ගොඩනැගිලි ආදී සියලුදේද.

එකී ඉඩමේ බී අක්ෂරය නම්වූ පාර්චස් දහහතකුත් දසම හයයි හතරක් (පා. 17.64) විශාල බෙදාවෙන් කල ඉඩම් කැබැල්ල එහි තුල පිහිටි සියලුදේ ද.

3. එකී ඉඩමේ සී අක්ෂරය නම්වූ පාර්චස් තිස්පහකුත් දසම හතරයි අටක් (පා. 35.48) විශාල බෙදාවෙන් කල ඉඩම් කැබැල්ල සහ එහි තුල පිහිටි ගොඩනැගිලි ආදී සියලුදේද වේ.

ජී. ඩබ්ලිව්. ජිවර්ඩ් ද සිල්වා,
බලයලත් වෙන්දේසිකාර,
උසාවියේ කොමසාරිස්.

වතුගෙදර,
කුරුඳුවත්තේ දී ය.

5–165—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් | ... | 73.04.19 බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදාදා | දවල් 12.00 |
| | | 73.04.27 සිකුරාද | ... | 73.04.18 බදාදා | දවල් 12.00 |
| මැයි | ... | 73.05.04 සිකුරාද | ... | 73.04.25 බදාදා | දවල් 12.00 |
| | | 73.05.11 සිකුරාද | ... | 73.05.02 බදාදා | දවල් 12.00 |
| | | 73.05.18 සිකුරාද | ... | 73.05.09 බදාදා | දවල් 12.00 |
| | | 73.05.25 සිකුරාද | ... | 73.05.15 අඟහරුවාද | දවල් 12.00 |
| ජූනි | ... | 73.06.01 සිකුරාද | ... | 73.05.23 බදාදා | දවල් 12.00 |
| | | 73.06.08 සිකුරාද | ... | 73.05.30 බදාදා | දවල් 12.00 |
| | | 73.06.14 බ්‍රහස්පතින්ද | ... | 73.06.06 බදාදා | දවල් 12.00 |
| | | 73.06.22 සිකුරාද | ... | 73.06.13 බදාදා | දවල් 12.00 |
| | | 73.06.29 සිකුරාද | ... | 73.06.20 බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.